**ශීර්ෂය - 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

--------------

**1.1 මතය**

--------

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 02 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ක්‍රියාකාරී සැලැස්ම අනුව භාර හා බුදල්වලට අදාලව මහා භාරකාර ආඥා පනත යටතේ අය කරන ලද මූලධන, ආයෝජන ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු ලෙස රු.6,800,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබු අතර ර.12,851,939 ක ආදායමක් රැස් කර තිබු බව මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය විය. එය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 188 කි. ඒ අනුව ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය විය. | කොරෝනා වසංගත තත්ත්වය නිසා ආයෝජන සඳහා ලැබිය යුතු පොලී ප්‍රමාද වී ලැබීම, නව භාරයන් කිහිපයක් ආරම්භ කිරීම හා සිදු කිරීමට නොහැකිවූ ආයෝජන එම වර්ෂය තුලදී සිදු කර තිබීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායම වැඩි වී ඇති අතර නිශ්චිත අගයක් පුරෝකථනය කිරීමට නොහැකිව ඇත. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු බව. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 09 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 6 ක් සඳහා අවශ්‍ය රු. 16,700,000ක් වූ මුළු ප්‍රතිපාදනයම සපයාගෙන | කොරෝනා වසංගතය තත්ත්වය හේතුවෙන් වියදම් සීමා වීම, පුහුණු වැඩසටහන් නොපැවැත්වීම සහ මිලදී ගැනීම් සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවිය. | සපයා ගනු ලැබූ ප්‍රතිපාදන අදාල කාර්යයට යෙදවිය යුතු බව. |

තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුළු ප්‍රතිපාදනයෙන් රු.7,245,549 ක් හෙවත් සියයට 17 සිට සියයට 97 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

**-----------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| බැරකම් හා බැඳීම්වලට අදාලව පෞද්ගලික අංශය සමඟ එළැඹෙන ලද එකතුව රු.128,200 ක් වූ බැරකම්, බැරකම් ලේඛනයේ සඳහන් කර නොතිබුණි. | අතපසුවීමකින් බැරකම් ලේඛනයේ සටහන් කර නොතිබුනත් වැය ලෙජරයේ පෙර වර්ෂයේ ගිණුම්ගත බැදීමක් ලෙස ඇතුලත් කර ඇත. | අදාල බැරකම්, බැරකම් ලේඛනයේ ඇතුළත් කළ යුතු බව. |

**2.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

**-------------------------------------------**

| | **නිරීක්ෂණය** | | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- | --- | --- |
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | 1922 අංක 01 දරන මහා භාරකාර ආඥා පනතේ 47 (1) වගන්තිය | | භාර බුදල් ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු වුවත් 2020 වර්ෂය සඳහා පිළියෙල කරන ලද භාර බුදල් අවසාන ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2022 මාර්තු 29 දින වේ. තවද, 2021 වර්ෂය සඳහා පිළියෙල කරන ලද භාර බුදල් අවසාන ගිණුම් මෙම වාර්තාවේ දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ භාර බුදල් අවසාන ගිණුම් නව භාර බුදල් පද්ධතිය මඟින් ලබා ගෙන ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. | අදාල ගිණුම් නියමිත දිනට විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | | |
| (i) මුදල් රෙගුලාසි 396 | 107,147 | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ වටිනාකම රු.107,147 ක කල් ඉකුත් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | වැටුපෙන් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් අය කලද අරමුදලේ ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රමාද වීම නිසා චෙක්පත් බැර කිරීමට ප්‍රමාද විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | | 268(අ) පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 268 (අ) පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ දෛනික ධාවන සටහන් ඉදිරිපත් කළ හැකිය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (iii) මුදල් රෙගුලාසි 1647 (ඉ) | | දෙපාර්තමේන්තුව විසින් වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | වාහන ලයිස්තුගත කිරීමේ ලේඛනයක් කඩිනමින් සකසා ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගත යුතු වුවත්, අධිකරණ අමාත්‍යාංශය මඟින් 2019 වර්ෂයේදි දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ වාහන 3ක අයිතිය නිරවුල් කර වටිනාකම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන දෙපාර්තමේන්තු ව නමින් මේ වන විට හරවාගෙන ඇත. ආයතන විශාල ප්‍රමාණයකට වාහන නිකුත් කළ බවත් ඉදිරියේදී අයිතිය නිරවුල් කිරීමේ ලේඛන සියලුම ආයතනවලට එකවර නිකුත් කරන බවත් අධිකරණ අමාත්‍යාංශයෙන් ප්‍රකාශ කරන ලදී . | අයිතිය නිරවුල් කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |
| (ඈ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තාව ඉදිරි වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාල වාර්තා, මෙම වාර්තාවේ දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2020 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මාස 09 ක කාල ප්‍රමාදයකින් පසුව 2022 පෙබරවාරි 09 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ දිනවල සිදු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 පාඩු හා හානි

--------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 ජනවාරි 27 දින අංක 65-0763 දරන වාහනයට අදාලව සිදු වූ අනතුර සම්බන්ධයෙන් වූ රු.254,038 ක අලාභය අදාල රියැදුරුගෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ පවරා තිබූ නඩුව සම්බන්ධව පසුවිපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නිෂ්ප්‍රභ වී තිබූ අතර අනතුර සිදු වී වසර 15 ක් ගත වුව ද, පාඩුව වගකිව යුතු අයගෙන් අය කර ගෙන නොතිබුණි . | අදාල නඩුව සම්බන්ධයෙන් නැවත සොයා බලා කටයුතු කරන බව කාරුණිකව දන්වමි. ඉදිරි විගණන හා කළමනාකරණ රැස්වීමේදී මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට ද සටහන් කර ගන්නා ලදී. | අලාභය අදාල පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති කාර්යසාධන දර්ශක 09 න් 04 ක තත්‍ය නිමැවුම, අපේක්ෂිත නිමැවුමෙන් සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් මතුවීම මෙම අපේක්ෂිත නිමැවුම අඩු මට්ටමක පැවතීමට හේතු විය . | හඳුනාගත් ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස්වල භාරකාරිත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුව ද එම කාර්යය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශකයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී කාර්යසාධන දර්ශකයන්ට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කාර්යභාරය අනුව කාර්යසාධන දර්ශක හඳුනා ගත යුතු බව. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ අනපනත් මඟින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති සුවිශේෂී කාර්යභාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුව නමින් සකස් කර තිබූ වෙබ් පිටුවේ ද සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පරිශීලනය කිරීම සඳහා මෙන්ම අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හා මහජනයාගේ අවශ්‍යතාවන්, ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රශංසා පලකිරීමට හැකිවන පරිදි පහසුකම් සලසා යාවත්කාලීන කර නොතිබුණි. ඊට අදාලව පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන් කරුණු දක්වා තිබුණද ඒ සම්බන්ධව අවධානය යොමු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව නමින් විවෘත වී ඇති වෙබ් අඩවියේ සිංහල මාධ්‍යයෙන් තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු සිදු කරන අතර භාෂා පරිවර්තක නිලධාරියෙකුගේ සහාය ලබා ගෙන දෙමළ මාධ්‍යයෙන් තොරතුරු ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මහජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කිරීමේදී කාර්යක්ෂමව කටයුතු කළ යුතු බව. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 87 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 66 ක් විය. ඒ අනුව නිලධාරීන් 21 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර 2021 පෙබරවාරි 09 දින සිට පරිපාලන නිලධාරී තනතුර සහ 2015 වසරේ සිට භාෂා පරිවර්ථක තනතුර පුරප්පාඩු වී පැවතුණි. | භාෂා පරිවර්තක හා පරිපාලන නිලධාරි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම පිළිබඳ කටයුතු කරමින් පවතී. ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු පිළිබඳව PACIS මෘදුකාංගය ඔස්සේ ද යාවත්කාලීන කරනු ලබයි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 2001/18 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ,වර්ෂ 5ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් , දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5ඉක්ම වූ නිලධාරීන් 12 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ වර්ෂ 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගෙන් 17 දෙනෙකු කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන-ඛණ්ඩ 2) සේවයට අයත් නිලධාරීන් වන අතර ඔවුන් දෙපාර්තමේන්තුගත නිලධාරීන් වන බැවින් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි .<br>ඉතිරි නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කළ ද ඒ සඳහා අවස්ථාවක් නොලැබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාන මාරු වීම් ලබා දිය යුතු බව. |